Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-01-21

පැමිණිලිකරු : ටී.ජී ජයවීර මයා,
නියාගම,
තල්ගස්විල.

වගඋත්තරකරුවන් : එස්.කේ.ඩී ද සිල්වා මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
නාගොඩ.

වර්ථමාන සේවා ස්ථානය - පොලිස් ස්ථානය,
සියඹලාන්ඩුව

**පැමිණිලි අංකය : HRC/MT/398/11**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, නීති විරෝධී අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, 2011.07.24 වන දින ප.ව 4.00 ට පමණ නිවසේ රැඳී සිටියදී වගඋත්තරකරුවන් පිරිසක් පැමිණ තම පුතා පිළිබඳව විමසන ලද බවත්, එවිට තම පුතා පොලිස් ස්ථානයට ගිය බවට තමා විසින් ප්‍රකාශ කළ බවත්, එහිදී තම පුතා පොලිස් ස්ථානයෙන් පැන ගොස් ඇති බවට තමා වෙත ප්‍රකාශ කර ඔහු භාරදෙන ලෙසට දන්වන ලද බවත්ය. නමුත් තමා එම අවස්ථාවේදී තම පුතා පිළිබඳව තොරතුරු නොදැන සිටි හෙයින් ඔහුගේ ජංගම දුරකථනයට ඇමතුම් කිහිපයක් ලබා ගත්තද සම්බන්ධ කරගත නොහැකි වූ බවත් දන්වා ඇත. ඉන් පසු සුළු වේලාවකින් පොලීසියේ ජීප් රථය පැමිණ පොලිසියේ ලොකු මහත්මයා විසින් තම පුතා වෙනුවට තමාව ගෙන යන බවට දන්වා තම බෙල්ලේ පිටුපසින් අල්ලා ජීප් රථය තුළට තල්ලු කරන ලද බවත්, එහිදී තමා අසනීපයෙන් සිටින බවට හා ප්‍රතිකාර ලබා ගන්නා බවට ප්‍රකාශ කළ විට "එහේ ගිහින් බෙහෙත් දෙන්නම්" කියා තර්ජණය කර පොලිස් ස්ථානය තුළට

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
සභාපති / தவிசாளர் / Chairman: 2696470
ලේකම් / செயலாளர் / Secretary: 2689558
ෆැක්ස් / தொலைநகல் / Fax: 2694924
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 2689064
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ගෙන ගොස් පැය 3 කට අධික කාලයක් රඳවා තබා ගන්නා ලද බවත්, පසුව තම පුතා පොලිස් ස්ථානයට පැමිණි පසු ඔහුගේ ඇපකරු ලෙස පැමිණිලිකරුගේ අත්සන් ලබාගෙන රාත්‍රී 10.00ට පමණ මුදවා හැර ඇති බවත් පැමිණිල්ලේ දක්වා ඇත.

එසේම පැමිණිලිකරු වසර 28කට වඩා වැඩි කාලයක් මහජන බැංකුවේ සේවය කර ඇති ප්‍රදේශයේ වැදගත් අයුරින් මහජන සම්බන්ධතා සහිතව ජීවත් වන පුද්ගලයෙකු වන බවද, වගඋත්තරකරුගේ ඉහත ක්‍රියාකලාපය හේතුවෙන් තමා මහත් අපකීර්තියකට හා හිත් වේදනාවකට පත්වූ බවද දක්වා ඇති අතර, ඒ අනුව තමාට සිදු වූ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව මැදිහත් වී සහන ලබා දෙන ලෙස මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිල්ලට අදාළව වගඋත්තරකරු විසින් 2012.01.01 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවට අනුව පැමිණිලිකරුගේ පුතා වන ටෙරී හේමාල් ජයවීර සහ තවත් තිදෙනෙකුට විරුද්ධව 2011.07.24 වන දින පොලිස් ස්ථානයට සිදුකරන ලද පැමිණිල්ලක් අනුව එකී ටෙරී හේමාල් ජයවීර යන අය 2011.07.24 දින පැය 17.05 ට පමණ පොලිස් ස්ථානයට භාරවීමෙන් පසුව සේවයේ යෙදී සිටි උපසේවක කා.පො.කො 8715 කාංචනා විසින් අත්අඩංගුවට ගෙන ඇති බව දක්වා ඇත. වගඋත්තරකරු ඒ අවස්ථාවේදී ස්ථානයෙන් බැහැරව සිට පැය 10.35 ට පමණ නැවත පොලිස් ස්ථානයට පැමිණෙන ලද බවත්, පසුව මෙම ටෙරී හේමාල් ජයවීර යන අයගෙන් ප්‍රකාශ සටහන් කිරීමෙන් පසු එදිනම පැය 21.00 ට ඇප මත මුදා හැර ඇති බවත් දක්වා ඇත. ඒ හැර මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති කරුණු වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කරන බවද දක්වා ඇත.

**පැමිණිල්ලට අදාළ වැඩිදුර කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව පැමිණිලිකරුගේ පුතා වන ටෙරී හේමාල් ජයවීර යන අය විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, ඉන් සඳහන් කර ඇත්තේ 2011.07.24 වන දින තමා නිවසේ සිටියදී නාගොඩ පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දන්වා ප.ව 1.00 ට පමණ පණිවිඩයක් ලද බවත්, ඒ අනුව 1.30 - 1.45 ත් අතර කාලයේදී තමා පොලිස් ස්ථානයට ගොස් ස්ථානාධිපතිවරයා හමු වූ බවත්ය. එම අවස්ථාවේදී ස්ථානාධිපතිවරයා ඉදිරියේ අමිත උදය කුමාර යන අය වාඩි වී සිටි අතර, එම තැනැත්තාට එදින උදේ තල්ගස්වලදී සිදුවූ පහරදීමක් පිළිබඳව ස්ථානාධිපතිවරයා විසින් තමාගෙන් ප්‍රශ්න කර සිටි බවද සඳහන් කර ඇත. එහිදී තමා එම අයට පහර නොදුන් බවට ප්‍රකාශ කළ මුත් තමාට එළියෙන් වාඩි වී සිටින ලෙසට දන්වා අමිත උදය කුමාර යන අයට රෝහල්ගතවන ලෙසට දන්වන ලද බවත්, පසුව තමාගෙන් ප්‍රකාශයක් ලබාගෙන පැය දෙකක

පමණ කාලයක් පුටුවක වාඩිකරවා සිටි බවත් දක්වා ඇත. පසුව සවස 5.00 ට පමණ රිසව් නිලධාරියා විසින් සහ තවත් පොලිස් නිලධාරීන් කිහිප දෙනකු විසින් තමා හට නිවස බලා යන ලෙසට දැනුම්දුන් බවත් ඒ අනුව තමා දළු එකතු කරනු ලබන ස්ථානයට ගිය බවත් සඳහන් කර ඇත. අනතුරුව සවස 7.00 ට පමණ තම මව තමාට අමතා තම පියාව නාගොඩ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ජීප් රථයෙන් පැමිණ රැගෙන ගිය බවට දැනුම්දීම මත තමා රාත්‍රී 9.00 ට පමණ නාගොඩ පොලිස් ස්ථානයට ගිය බවත්, එහිදී තම පියා පුටුවක වාඩි කරවා සිටිනු දුටු බවත් සඳහන් කර ඇත. පසුව තමාට සහ තම පියාට පොලිස් ස්ථානාධිපතිවරයාගේ කාමරයට පැමිණෙන ලෙසට දැන්වීම මත එහි ගිය විට 'අත්අඩංගුවෙන් පැන ගියවිට මෙවැනි දේ සිදුවන බවට' නීතියේ සඳහන් බවට පවසා නීති පොතක් පෙන්වමින් තමාට බැන වැදුනු බවත්, පසුව 'අත්සන් කර ආපසු යන ලෙස' දන්වා සිටි අතර, තමා සහ තම පියා රාත්‍රී 10.00ට පමණ තම නිවසට පැමිණි බවත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණය :-**

වගඋත්තරකරු විසින් සිද්ධියට අදාළ බී වාර්තා සහ පොලිස් උධෘත වල පිටපත් කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

ඒ අනුව මුල් පැමිණිල්ල පොලිස් ස්ථානයේ ගොනු කර ඇත්තේ, 2011.07.24 දින පැය 15.30 ට වන අතර, එය සුළු පැමිණිලි පොතෙහි I 168/243 යටතේ සටහන් කොට ඇති බවත්, එහි වගඋත්තරකරු වන ටෙරී හේමාල් ජයවීර යන අය අත්අඩංගුවට ගැනීම එදිනම පැය 17.05 ට පිටුව 169/244 යටතේ සටහන් කොට ඇති බවත් නිරීක්ෂණය වේ. එසේම වගඋත්තරකරු ප්‍රකාශ සටහන් කර ගැනීම එදිනම පැය 17.25 ට 170/245 යටතේ සිදුකර අතර, වගඋත්තරකරු හට එදින පැය 21.00 ට 172/246 යටතේ ඇප ලබා දී ඇති බවද නිරීක්ෂණය වේ.

නාගොඩ පොලිස් ස්ථානයේ රථවාහන තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද පිටපත් අනුව වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා 2011.07.24 වන දින පැය 16.45 ට පිටු අංක 341 හි 129 ඡේදය යටතේ අංක 61-5411 ජීප් රථයෙන් දූෂණ මර්දන වැටලීම් රාජකාරී සඳහා පිටත්ව ගොස් ඇති අතර, එහිදී කාරියවසම් බෝවතන්ත්‍රි අමිත උදය කුමාර යන අය විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට පියවර ගත් බවට සටහන් කර ඇත. එසේම වගඋත්තරකාර ස්ථානාධිපතිවරයාගේ පැමිණීම එකී පිටුවේ ඡේද අංක 130 යටතේ සටහන් වී ඇති අතර, පැය 18.35 පැමිණි බවට එහි දැක්වේ. අදාළ පහරදීමට අවශ්‍ය සැකකරු වන ටෙරී හේමාල් ජයවීර හා තවත් අය සොයා සංචාරය කරන අතර, සැකකරුගේ මව සහ පියා හමු වී මෙම සැකකරු අත්අඩංගුවට ගැනීම පිළිබඳව සොයා බැලූ බවත්, නමුත් සැකකරු පොලිස් ස්ථානයට භාර වී ඇති බවට තොරතුරු අනාවරණය වූ බවත් එහි සටහන් යොදා ඇති බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයාගේ ප්‍රකාශයට අනුව ටෙරී හේමාල් ජයවීර නැමැති සැකකරු පොලිස් ස්ථානයට භාර වීමෙන් පසුව අත්අඩංගුවෙන් මිදී යාම සම්බන්ධයෙන් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන ඔහුගේ පියා පොලිස් ස්ථානයට රැගෙන යාම යන කාරණය ප්‍රතික්ෂේප කර ඇත.

නමුත් පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ මඟින් පැමිණිලිකරු නීති විරෝධී ආකාරයෙන් පොලිස් ස්ථානයට ගෙන යාම පිළිබඳව තහවුරු වී ඇත.

එසේම වගඋත්තර පාර්ශවයන්ගේ ධාවන සටහන් අනුව සැකකරු අත්අඩංගුවට ගැනීම වෙනුවට ඔහුගේ පියා පොලිස් ස්ථානයට රැගෙන ආ වේලාවද සනාථ වී ඇති අතර, පැය 17.05 ට පොලිස් ස්ථානයට පැමිණ භාරවීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇති සැකකරුගේ ප්‍රකාශය එදිනම පැය 17.25 ට සටහන් කර තිබුනද ඔහු ඇපපිට මුදවා හැර ඇත්තේ එදින පැය 21.00 ට බවද නිරීක්ෂණය වේ.

එසේම ඇපකරු වශයෙන් එම අයගේ පියා වන කොටගොඩ ගමගේ ජයවීර නැමැති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු බැඳුම්කරය අත්සන් කර ඇති බව දක්වා තිබුනද එකී පැමිණිලිකරු ඒ සඳහා පොලිස් ස්ථානයට පැමිණි ආකාරය පිළිබඳව කිසිදු තොරතුරක් ඉදිරිපත් කර නොමැත.

**නිගමනය :-**

ඉහත කී සමස්ථ කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා විසින් මෙම පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති කරුණු පිළිගත නොහැකි බවත්, පැමිණිලිකරුගේ පුතා වෙනුවට පැමිණිලිකරු අත්තනෝමතිකව පොලිස් භාරයට ගෙන රඳවා තබාගෙන ඇති බවත් කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1. වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකරු වෙත රු. 50,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2. මෙම වගඋත්තරකරු සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපත් පොලිස්පතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2016. . දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

Udagama

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

CHAIRMAN

Udagama

COMMISSIONERS

B/

පිටපත :- මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මාතර.